**පොදු දේපළ රැකගැනීමේ වැඩසටහන**

**பொது வளங்களை பாதுகாப்பதற்கான திட்டம்**

**Programme for Protection of Public Resources**

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

No 183/5, High Level Road, Colombo 06   Tel: 011 5627432   Fax: 011 5882225   Email: 2015pppr@gmail.com

2015- 01-06
PPPR/MM/SR 04 (Radio)

# ජනාධිපතිවරණයේදී රාජ්‍ය මාධ්‍ය (ගුවන් විදුලිය) හැසිරීම පිළිබඳ නිරීක්‍ෂණ - වාර්තා අංක 04

රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිතා කිරීමෙන් සිදුවන මහජන මුදල් නාස්තිය අවම කිරිමේ අරමුණින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) ක්‍රියාත්මක කරන පොදු දේපළ රැකගැනිමේ වැඩසටහන යටතේ, රාජ්‍ය මාධ්‍යවල හැසිරීම පිළිබඳව මෙම මාධ්‍ය නිරීක්‍ෂණ මගින් අවධානය යොමු කරනු ලැබේ.
සම්මත වෘත්තීය ප්‍රමිතීන්ට අනුව රාජ්‍ය මාධ්‍ය එහි වගකීම ඉටු කිරීමේදී නිරවද්‍ය, සමබර, අපක්ෂපාතී හා අපාක්ෂික ආකාරයෙන් තොරතුරු ලබා දෙන්නේද? විවාදය සහ සාකච්ඡාව සඳහා සුදුසු මහජන වේදිකාවක් සැපයීම මගින් ඡන්දදායකයාට දැනුම්වත් තීරණයක් ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසන්නේද? යන කරුණු කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ක්‍රමවේදය මගින් මාධ්‍යවල අන්තර්ගතය සහ එහි අර්ථ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරනු ලැබේ. මෙහිදී ජනමාධ්‍යයේ පිළිගත් ප්‍රමිතීන් සහ ආචාර ධර්මානුකූල මාධ්‍ය  භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ.

මැතිවරණ සමයේ රාජ්‍ය මාධ්‍ය හැසිරීම පිළිබඳව නිරීක්ෂණ සිදුකරමින් වරින්වර මෙවැනි වාර්තා ඉදිරිපත් කිරීමටත්, මැතිවරණය අවසානයේ ඒ පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් පොදු දේපළ රැකගැනීමේ වැඩසටහනේ මාධ්‍ය නිරීක්ෂණ කණ්ඩායම අපේක්ෂා කරයි.  මෙම වාර්තාවේ අපගේ නිරීක්‍ෂණ පිළිබඳ ඔබගේ ප්‍රතිචාර හා ජනාධිපතිවරණයේ රාජ්‍ය මාධ්‍ය භාවිතය පිළිබඳව ඔබගේ නිරීක්‍ෂණ අප වෙත යොමු කරමින් මෙම කාර්යය වඩාත් සාර්ථක කරගැනිමට ඔබටත් දායක විය හැකිය.

අපගේ ලිපිනය
pppprmm@gmail.com
මාධ්‍ය නිරීක්ෂණ, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, අංක 183/5, හයිලෙවල් පාර, කොළඹ - 06.


මෙම නිරීක්ෂණ වාර්තාව මගින් සලකා බැලෙන්නේ දෙසැම්බර් 24, 25, 26 දින තුන තුළ ශ්‍රී **ලංකා ගුවන් විදුලි සංස්ථාවේ City FM හා ස්වාධීන රූපවාහිනී ජාලයට අයත් 'ලක්හඬ' නාලිකාවේ** උදෑසන ප්‍රවෘත්ති විකාශයන්හි (සිංහල) ගුවන් කාලය ජනාධිපති අපේක්‍ෂකයින් 19 දෙනා සඳහා බෙදී ගොස් ඇති ආකාරය යි.  මෙම විශ්ලේෂණයේ දී ප්‍රවෘත්ති විකාශනයේ සමස්ත කාලයෙන් මැතිවරණ ප්‍රවෘත්ති සඳහා යොදා ගෙන තිබූ කාලය වෙන් කර හඳුනා ගනිමින් එය ජනාධිපති අපේක්‍ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කර තිබේ.

මෙම අධ්‍යයනයේ දී **ජනාධිපතිවරණයට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය** උපමාන දක්වෙන **අතිවිශේෂ ගැසට් නිවේදනය**[1] හා පිළිගත් ජනමාධ්‍ය ප්‍රමිතීන් මත පිහිටා අපගේ නිරීක්ෂණ සිදු කර තිබේ.

## ජනාධිපතිවරණයේ දී රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය හැසිරීම

## (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - City FM)

අදාළ දින 3 තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ **City FM** උදෑසන 6.00 ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 68 තත්පර 46 කි. එයින් විනාඩි 16 තත්පර 58 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 23 තත්පර 22 කාලයක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. එයින් මැතිවරණයට අදාළ ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 28 තත්පර 24 කි. අදාළ දින 3 තුළ මැතිවරණ පුවත් අතර මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ තත්පර 42 ක් පමණකි. (1.01%)




(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය බෙදී ගොස් ඇති අයුරු)


- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුම්වත් කිරීම

[1] 2014 නොවැම්බර් 14 දින අංක 1890/2, www.documents.gov.lk

# <u>දින තුනෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති සමස්ත කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය</u>

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (City FM) - උදෑසන 6:00 ප්‍රවෘත්ති

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්


**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින තුනෙහි ම ප්‍රවෘත්ති විකාශය තුළ පැහැදිලි ඉඩක් (විනාඩි 24 තත් 36ක්) වෙන් ව ඇතත් සෙසු ජනාධිපති ධූර අපේක්ෂකයින් අතරින් නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට (පොදු අපේක්ෂකයාට) හැර (විනාඩි 3 තත්පර 48) වෙනත් කිසිදු අපේක්ෂකයකුට කිසිදු ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම් සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මක භාවිතා වී ඇති බව නිරීක්ෂණය වන අතර නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට වෙන් වී ඇති කාලයෙන් කොටසක් ඔහු සහභාගී වූ රැස්වීම් ආවරණය සඳහා ද ඉතිරි කාලය ඔහුගේ අපේක්ෂක ප්‍රතිරූපය පහත හෙළීම සඳහා ද භාවිතා කර ඇති බව නිරීක්ෂණය වේ.

# ස්වාධීන රූපවාහිනී ජාලය (ලක්හඬ) - උදෑසන 'පුවත් හෝරාව'

අදාළ දින 3 තුළ ලක්හඬ උදෑසන 'පුවත් හෝරාව' **(6:00 - 7:00)** සඳහා වෙන් වී ඇති සමස්ත කාලය විනාඩි 116 තත්පර 07 කි. එයින් විනාඩි 11 තත්පර 53 ක කාලයක් ප්‍රවෘත්ති විකාශය තුළ දැන්වීම් සඳහා වෙන් වී ඇති අතර විනාඩි 15 තත්පර 51 ක් මැතිවරණයට අදාළ නොවන සෙසු පුවත් සඳහා වෙන් වී තිබේ. මැතිවරණයට අදාළ සමස්ත පුවත් කාලය විනාඩි 86 තත්පර 15 කි. අදාළ දින 3 තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය (Voter Education) සඳහා වෙන් වී ඇත්තේ විනාඩි 2 තත්පර 48 ක් පමණකි. (2.41%)





(ප්‍රවෘත්ති සඳහා වෙන් වූ සමස්ත කාලය බෙදී ගොස් ඇති අයුරු)

- මැතිවරණයට අදාළ පුවත්
- මැතිවරණයට අදාළ නොවන පුවත්
- වෙළඳ දැන්වීම්
- මැතිවරණයට ගැන ඡන්දදායකයා දැනුම්වත් කිරීම්

## <u>දින තුනෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති සමස්ත කාලය ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය</u>

### ලක්හඬ - උදෑසන 'පුවත් හෝරාව'

විනාඩි.




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්

**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාට (වත්මන් ජනාධිපති) සිය පක්ෂයේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා දින තුනෙහි ම 'පුවත් හෝරාව' තුළ ඉඩක් වෙන් ව ඇතත් (විනාඩි 60 තත් 09 ක්) සෙසු ජනාධිපති ධූර අපේක්ෂකයින් අතරින් නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට (පොදු අපේක්ෂකයාට) හැර (විනාඩි 26 තත්පර 06 ) වෙනත් කිසිදු අපේක්ෂකයකුට ඉඩක් වෙන් වී නොමැති බව නිරීක්ෂණය වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් වෙන් වී ඇති සමස්ත කාලය ම ඔහුගේ පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම් සහ ප්‍රතිරූපය ගොඩ නැංවීම සඳහා ධනාත්මකව භාවිතා වී ඇති බව නිරීක්ෂණය වේ. 'වෙන් කෙරුණු කාලය' බෙදී ගොස් ඇති ආකාරය සැලකූ විට නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ අපේක්ෂකයාට වෙන් වී ඇති කාලය වැඩි වශයෙන් භාවිතා වී ඇත්තේ අපේක්ෂක ප්‍රතිරූපය බිඳ හෙළීම සඳහා බව නිරීක්ෂණය වේ.

**<u>පොදු නිරීක්ෂණ</u>**

මෙම දින තුනෙහි විද්‍යුත් මාධ්‍ය (ගුවන් විදුලි) ප්‍රවෘත්ති සඳහා වෙන් වී ඇති කාලය පිළිබඳව නිරීක්ෂණය කිරීමේ දී නාලිකා දෙකෙහි ම මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා වෙන් කොට ඇත්තේ සමස්ත ප්‍රවෘත්ති කාලයෙන් **3% කට අඩු කාලයක්** බව විශේෂයෙන් නිරීක්ෂණය වේ.

විද්‍යුත් මාධ්‍යයට අදාළව අපගේ මුල් වාර්තාවලින් පෙන්වා දුන් ආකාරයට මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති උපමාන හා නිරවද්‍ය, සමබර, අපක්ෂපාතීභාවය ආදී සම්මත මාධ්‍ය ප්‍රමිතීන් රැසක් ගුවන් විදුලි මාධ්‍ය භාවිතය තුළ ද දැඩි ලෙස උල්ලංඝනය වෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

රජයේ ගුවන් විදුලි නාලිකා මෙලෙස ඒකපාර්ශ්වික නැඹියාවකින් කටයුතු කිරීම මෙම මැතිවරණයේ නිදහස් හා ස්වාධීනභාවයට බාධාවක් වන අතර එමගින් සෙසු අපේක්ෂකයින්ට අසාධාරණයක් සිදු වී ඇති බව ද පෙනී යයි.

මීට පෙර අපගේ නිරීක්ෂණ වාර්තා මගින් පෙන්වා දුන් පරිදි මැතිවරණ කොමසාරිස්වරයාගේ උපමාන හා පිළිගත් ජනමාධ්‍ය වෘත්තීය ආචාර ධර්ම නොසලකා කටයුතු කරන තත්ත්වය මුද්‍රිත හා රූපවාහිනී මාධ්‍ය තුළ සේ ම ගුවන් විදුලි මාධ්‍යය තුළ ද එලෙස ම ක්‍රියාත්මක වෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

එස්. රනුග්ගේ

විධායක අධ්‍යක්ෂ

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා